00186

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
මානව ශාස්ත්‍ර සහ සමාජ විද්‍යා අධ්‍යයන පීඨය
නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව
නීතිවේදී උපාධි පාඨමාලාව - 4 මට්ටම
අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I - 2022/2023
LLU4806/LWU2312 – අපරාධ නීතිය
කාලය - පැය 1

---

දිනය : 2023 සැප්තැම්බර් 27 | වේලාව: පෙ.ව 11.30 - ප.ව 12.30

---

එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.

අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

1. "සාවද්‍ය මනස යන්න අභියාචක හට චෝදනා නැගී ඇති වරදෙහි අත්‍යවශ්‍ය අංගයක් වේ. සාමාන්‍ය නීතියෙහි පිළිගෙන ඇති පරිදි අභිචෝදක පක්ෂය විසින් මෙම අංගය සාධාරණ සැකයෙන් ඔබ්බට තහවුරු කළ යුතුය යන අවශ්‍යතාවය ආඥා පනතෙහි කිසිදු තැනක බැහැර කර නොමැත."

*Van der Hultes vs. Attorney General* (1989) 1 SLR 204 at 215

ඉහත ප්‍රකාශය අනුසාරයෙන්,

(a) සාවද්‍ය මනස මූලධර්මයෙහි ස්වරූපයන් ලෙස 'නොසැලකිල්ල' සහ 'අනවධානය' යන සංකල්පයන් නිර්වචනය කරන්න.

(b) 'චේතනාව' යන්නෙන් එම සංකල්පයන් වෙනස් වන්නේ කෙසේදැයි විස්තර කරන්න.

අදාල නඩු තීන්දු හා උචිත ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන් ඔබගේ පිළිතුර තහවුරු කරන්න.

(ලකුණු 20)

2. 'සාක්ෂිකරුවන් බොරු කීමට ඉඩ ඇත. නමුත් පරිවේෂණයන් තමන් වෙනුවෙන් කථා කරයි'

*Ashok Dhondiram Dhavale vs. The State of Maharashtra* (Crim Appl No.904 / 2018)

(a) ඉහත ප්‍රකාශය අනුසාරයෙන් 'ඍජු සාක්ෂි' හා 'පරිවේෂණීය සාක්ෂි' අතර වෙනස පැහැදිලි කරන්න. ප්‍රායෝගික උදාහරණ ඇසුරෙන් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(b) පහත දැක්වෙන සංකල්පයන් ඔබේ වචන වලින් පැහැදිලි කරන්න.

(i) කරුණු
(ii) පාපොච්චාරණ

(5 x 2 = ලකුණු 10)

(මුළු ලකුණු 10+10 = 20)

-------- හිමිකම් ඇවිරිණි-------